**ගොවීන්ගේ භාරකාර අරමුදල - 2017**

**--------------------------------------**

ගොවීන්ගේ භාරකාර අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1994 මාර්තු 09 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරමුදලේ භාරකරුවන් අතර එළඹි භාරකාර ඔප්පුවේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

## 2.1 මතය

**-------**

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ගොවීන්ගේ භාරකාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයේ 150 ඡේදය ප්‍රකාරව ආස්ථිත්වයේ නිත්‍ය පිහිටි තැන සහ නෛතික ස්වභාවය සහ එය ක්‍රියාත්මක වන කලාපය, මෙහෙයුම් වල ස්වභාවය සහ එහි ප්‍රධාන කටයුතුවල විස්තරයක්, අස්ථිත්වයේ මෙහෙයුම් පාලනය කිරීමට අදාළ වන ව්‍යවස්ථාව පිළිබඳ යොමුවක් සහ පාලන අස්ථිත්වයේ නම පිළිබඳව තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ප්‍රමිතයේ 69 ඡේදය ප්‍රකාරව වත්කම් ක්ෂය කිරීම ආරම්භ කළ යුත්තේ එය පාවිච්චියට සුදුසු තත්ත්වයට පත් වූ පසුව වුවද ඊට පටහැනිව අරමුදලේ වත්කම් මිලදී ගත් වර්ෂයට සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

2014 වර්ෂයේදී පොහොර ගබඩාවක් ඉදිකිරීමට ලබාදුන් රු.315,000 ක අත්තිකාරම් මුදල පියවීම සඳහා පියවීමේ වවුචර් 02 ක් ඉදිරිපත් කිරීම නිසා සිදු වූ වරද නිවැරදි කිරීමේදී ඇති වූ දෝෂය හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සමුච්චිත අරමුදලේ ශේෂය සහ අදාල අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.630,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) 2002 වර්ෂයේ දී චක්‍රීය අරමුදල සහ කෘෂිකාර්මික භාර අරමුදල ඒකාබද්ධ කර ගොවින්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේ දී එයට පවරා දුන් පහත සඳහන් ශේෂයන් සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි හා පැහැදිලි කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විස්තරය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (i) ණයගැතියෝ | 11,103,076 | (i). ණයගැති කාල විශ්ලේෂණය<br>(ii). ශේෂ සනාථ කිරීමේ ලිපි<br>(iii). විස්තරාත්මක උපලේඛන |
| (ii) ගොවීන්ගේ තැන්පතු | 697,644 | විස්තරාත්මක තැන්පතු ලේඛනය |
| (iii) කොටස් ගිණුම | 591,965 | කොටස්කරුවන්ගේ නාම ලේඛනය |

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.53,269,600 ක් වූ අත්තිකාරම්, රු.140,107,383 ක් වූ ලැබිය යුතු කෙටිකාලීන ණය හා රු.178,565,300 ක් වූ ලැබිය යුතු දිගුකාලීන ණය සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**--------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට පැවති රු.140,177,028 ක්වූ ණයගැති ශේෂ අයකර ගැනීමකින් තොරව වර්ෂ 03 සිට වර්ෂ 16 දක්වා වූ කාලයක් ගිණුම්වල පෙන්වා තිබුණි. අයකර ගැනීම අවිනිශ්චිත ණයගැති ශේෂ වෙනුවෙන් අඩමාන ණය ප්‍රතිපාදනයක් සිදුකර නොතිබුණි.

(ආ) 2006 අංක 10 දරණ දේශීය ආදායම් බදු පනතට අනුව බදු ගෙවිය යුතු ආයතනයක් වුවද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ගෙවිය යුතු ආදායම් බදු ලෙස රු.30,204,611 ක් වෙන්කර තිබුණද මේ දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

**------------------------------------------------------------------------------------**

වක්ගල්මෝදර කරදිය පාලන ව්‍යාපෘතිය ඉටුකිරීම සඳහා ගාල්ල දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ගොවීන්ගේ භාරකාර අරමුදලින් ලබා දී තිබූ ප්‍රතිපාදන මත කාලගුණික දත්ත රැස්කිරීම වෙනුවෙන් මිලදී ගත් රු.1,102,500 ක් වටිනා උපකරණ 26 ක්, ගිං ගඟෙහි තවලම හා බද්දේගම යන ප්‍රදේශ වල සවිකර තිබූ රු.316,600 ක් වටිනා අධි සංවේදී උපකරණ 2 ක් හා රු.600,000 ක් වටිනා $A_0$ මුද්‍රණ (Plotter) යන්ත්‍රය ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 751 ප්‍රකාරව ගොවිජන සේවා දෙපාර්තුමේන්තුව ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයේ තොග පොත්වල ඇතුළත්කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**--------------------------**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.78,507,032 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.7,374,535 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.71,132,497 ක වර්ධනයක් විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම රු.47,914,180 කින් වැඩි වීම හා සංවර්ධන වියදම් රු.23,157,092 කින් අඩුවීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු. 11,516,238 ක් වූ අතිරික්තය 2014 වර්ෂයේදී රු.11,814,015 ක ඌණතාවක් වී 2015 වර්ෂයේ සිට අතිරික්තයක් වී සමාලෝචිත වර්ෂය වන විට එය රු.78,507,032 ක් දක්වා වර්ධනය වී තිබුණි. 2012, 2013 හා 2014 වර්ෂයන්හි සංවර්ධන වියදම් සඳහා දී තිබූ අත්තිකාරම් පියවීම් සියල්ල 2014 වර්ෂයේ පූර්ව ගැලපුම් ගිණුමට ගැලපීම හේතුවෙන් 2014 වර්ෂයේ අතිරික්තය සෘණ අගයක් වීමට හේතු වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ආදායම් බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේ දී 2013 වර්ෂයේ දී රු. 13,129,302 ක් වූ ආයතනයේ දායකත්වය 2014 වර්ෂයේදී රු. 9,954,152 ක සෘණ අගයක් වුව ද සමාලෝචිත වර්ෂය අවසානයට එය රු.80,045,382 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1. සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 (ආ) ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගොවි භාරකාර අරමුදල පිහිටුවීමේ භාරකාර ඔප්පුවේ සඳහන් අරමුණු ඉටු කිරීම සඳහා මෙන්ම සුළු ගොවීන්ගේ කෘෂිකාර්මික සංවර්ධනය හා සුභසාධනය සඳහා ප්‍රමාණාත්මක මට්ටමකට කටයුතු කිරීමකින් තොරව අරමුදල විසින් මුදල් ආයෝජනය කර පොලී ඉපයීම සිදුකර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අරමුදල විසින් රු.775,000,000 ක් ස්ථාවර තැන්පතු වලද රු.92,116,951 ක් භාණ්ඩාගාර බිල්පත්වලද ආයෝජනය කර තිබූ අතර සමස්ථ ආදායමෙන් සියයට 98.06 ක් ආයෝජන මගින් උපයන ලද පොලී ආදායම විය. එම ආදායමෙන් සංවර්ධන වියදම් සඳහා වැයකර තිබුණේ රු.21,606,833 ක් පමණි.

(ආ) එසේම ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන ගොවිසෙත ලොතරැයි ආදායමින් මෙම අරමුදලට අදාල ආදායම 2008 වර්ෂයෙන් පසුව ගොවි භාරකාර අරමුදල විසින් භාණ්ඩාගාරයෙන් නිදහස් කර ගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,797,191,269 ක ශේෂයක් ගොවි භාරකාර අරමුදලට භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස ගිණුම් සටහන් මඟින් දක්වා තිබුණ ද එම මුදල් ගොවීන්ට සෙත සැළසීමේ වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට අරමුදලේ අවධානය යොමුවී නොතිබුණි. භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු.2,778,635,023 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සංශෝධිත වැය ඇස්තමේන්තුව මඟින් ව්‍යාපෘති 51 ක් වෙනුවෙන් රු.496,888,486 ක් වූ මුදලක් ඇස්තමේන්තු කර තිබුණද, ඉන් පිරිවැය රු.296,818,486 ක් වූ ව්‍යාපෘති 35 ක් පමණක් ආරම්භ කර රු.168,546,076 ක මුදලක් නිදහස් කර තිබුණි. මේ අනුව ව්‍යාපෘති 16 ක් වෙනුවෙන් රු.200,070,000 ක් වූ ඇස්තමේන්තු මුදලක් කිසිඳු කටයුත්තකට උපයෝජනය කර නොතිබුණි.

(ඈ) මුදල් නිදහස් කර තිබූ ව්‍යාපෘති 35 ක් අතරින් වටිනාකම රු.14,892,103 ක් වූ ව්‍යාපෘති 06 ක් පමණක් අරමුදල විසින් අධීක්ෂණයට ලක්කර තිබූ අතර, අනිකුත් ව්‍යාපෘති සම්බන්ධයෙන් අරමුදල විසින් අධීක්ෂණයට ලක් කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාබනික රෙඩ්ලේඩි පැපොල් වගාව සඳහා මොරගොල්ලාගම ගොවි මහතෙකු වෙත රු.600,000 ක මුදලක් ඇපකරුවන්ගෙන් විධිමත් ඇප සුරැකුම් ලබා ගැනීමකින් තොරව 2015 නොවැම්බර් 16 දින නිදහස් කර තිබූ අතර ක්ෂේත්‍ර චාරිකා වාර්තාවල ප්‍රගතියක් නොමැති බව වාර්තා කර තිබියදීත් ඒ පිළිබඳ නොසලකා රු.400,000 ක්වූ දෙවන ණය වාරිකය 2016 මාර්තු 04 දින නිදහස් කර තිබුණි. විගණිත දිනය වූ 2018 ජුනි 06 දින වන විටත් ණය වාරික අය කර ගැනීමට හෝ නීතිමය පියවර ගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණි.

(ආ) 2002 වර්ෂයේදී චක්‍රීය අරමුදල හා කෘෂිකාර්මික භාර අරමුදල ඒකාබද්ධ කර ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේදී පවරන ලද රු.44,200,176 ක් වූ ණය ශේෂයන් අයකර ගැනීම පිළිබඳ සිය නිර්දේශ මාස 03 ක් මත ලබාදීමට විශ්‍රාමික නිලධාරීන් 10 දෙනෙකු 2016 අප්‍රේල් මස රු.1,450,000 ක දීමනාවක් මත පත්කර තිබුණි. එකී නිර්දේශයන් අනුව අයකරගත හැකි ලෙස හඳුනාගෙන තිබූ ණය ශේෂය රු.10,874,174 ක් පමණක් වූ අතර එයින්ද සමාලෝචිත වර්ෂයේ අවසන් වනවිට අයකර ගෙන පැවතියේ රු.2,351,391 ක් වූ සියයට 22 ක් වැනි අවම අගයක් විය.

## 4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------------

වක්ගල්මෝදර කරදිය පාලන ව්‍යාපෘතිය යටතේ කාලගුණික දත්ත රැස්කිරීම වෙනුවෙන් 2013 වර්ෂයේදී මිලදී ගත් රු.245,000 ක් වටිනා වර්ෂාමාන 10 ක් හා මිනුම් සරා 7 ක් ද, රු.19,200 ක් වටිනා සිතියම් දත්ත රැස්කිරීමේ දෘඩ තැටි 2 ක් ද වසර 5 ක කාලයක් නිශ්ක්‍රීයව ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ගාල්ල දිස්ත්‍රික් කාර්යාල ගබඩාවේ රඳවා තිබූ අතර ඒවායේ වගකීම් කාලයද ඉක්මවී ගොස් තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

ස්ථිර කාර්ය මණ්ඩලයක් නොමැතිවීම හේතුවෙන් ණය අයකර ගැනීමේ ප්‍රගතිය පහළ මට්ටමක වීම, නොපියවූ අත්තිකාරම් පැවතියදී නැවත නැවතත් අත්තිකාරම් ලබා දීම, ණය අයකර ගැනීමේ කාල ප්‍රමාදය, අය නොවන ණය කපා හැරීමට ලක් කිරීම ආදිය සිදුවීමෙන් අරමුදලේ මූල්‍ය කළමනාකරණය සතුටුදායක මට්ටමක නොපවතින බව නිරීක්ෂණය විය. මෙම කටයුතු සාර්ථක කරගැනීම සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් පත්කර ගැනීමට බඳවා ගැනීමේ කාර්යපටිපාටියක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට ආයතනය මෙතෙක් කටයුතු කර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

---------------------

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලඟාකර ගැනීම

----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ගොවීන්ගේ භාරකාර අරමුදල විසින් තම විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

(ආ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් ගොවීන්ගේ භාරකාර අරමුදල විසින් සිය විෂය පථයට අනුව ළඟා කර ගත යුතු තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන නොතිබුණි. කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇති අරමුණුවලට අදාලව ගොවීන්ගේ භාරකාර අරමුදලේ වැඩසටහන් සකස් කිරීමටත් ඒ අනුව උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනාගැනීමටත් නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමටත් අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් කිරීමටත් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය.
---------------------------------------------

### 6.1 අයවැය ලේඛනමය පාලනය.
-----------------------------------

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සියයට 54 සිට සියයට 162 දක්වා විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්
----------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුවේ.

| ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ණය පාලනය | (i). ප්‍රමාදයකින් තොරව ණය අයකර ගැනීම හා හඳුනා නොගත් ණය ශේෂ සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු නොකිරීම.<br>(ii). ණය ලබාදීම හා පොළී ප්‍රතිශතය සම්බන්ධව පොදු ප්‍රතිපත්තියක් නොවීම. |
| (ආ) කාර්ය මණ්ඩල කළමණාකරණය | ස්ථිර කාර්ය මණ්ඩලයක් නොමැතිවීම. |
| (ඇ) මෙහෙයුම් පාලනය | (i). ව්‍යාපෘති පසු විපරම් කටයුතු දුර්වල වීම.<br>(ii). නිවැරදි ඇස්තමේන්තු පිළියෙල නොකිරීම. |
| (ඇ) ගිණුම්කරණය | ලබාදුන් අත්තිකාරම් පියවීම් අදාල වර්ෂයේ ගිණුම්ගත නොකිරීම. |